# අන්තර්ජාලය තුළ හොඳ පුරුදු

- සමාජ මාධ්‍ය තුළ දැඩි රහස්‍යතා සැකසීම් භාවිතා කිරීම.
- ඔබගේ පුද්ගලික තොරතුරු රහසිගතව තබා ගැනීම.
- සැබෑ ජීවිතයේ නොහඳුනන නව මිතුරන් ඔබගේ සමාජ මාධ්‍ය වෙත එකතුකර නොගැනීම.
- සමාජ මාධ්‍ය හරහා යම් දෙයක් බෙදා ගැනීමට පෙර එහි සුදුසු/නුසුදුසු භාවය සිතා බලන්න.
- ඔබ ගේ පින්තූර, වීඩියෝ වැනි පුද්ගලික තොරතුරු අන්තර්ජාලය තුළ පළ කිරීමට පෙර ඒවා නැරඹිය හැකි පුද්ගලයින් පිලිබඳව සැලකිලිමත් වීම.
- සංකීර්ණ මුරපද භාවිතා කිරීම සහ මුරපද නිරන්තරයෙන් වෙනස් කිරීම.
- අසැබි හෝ නුසුදුසු අන්තර්ගතයක් බෙදා නොගැනීම.
- අන්තර්ජාලය තුළින් හමුවූ නන්නාඳුනන පුද්ගලයින් සැබෑ ජීවිතයේදී එක්වරම මුණගැසීමට නොයෑම.
- ඔබ වෙත ලැබෙන සැක කටයුතු සබැඳි (Link) වෙත පිවිසීමෙන් වැලකීම.
- ඔබගේ වෙබ් කැමරාව සහ මයික්‍රෆෝනය අක්‍රිය කොට ඇත්දැයි පරීක්ෂාකාරී වීම.

# අන්තර්ජාලය තුළ ආරක්ෂාවීමට ගත හැකි පියවර

සමීප මිතුරන්ට පමණක් ඔබව සමාජ මාධ්‍ය තුළ සෙවීම. ටැග් කිරීමට සහ ඔබ සමඟ විවිධ අන්තර් ගතයන් බෙදා ගැනීමට හැකි වන පරිදි ඔබේ රහස්‍යතා සැකසීම් භාවිතා කරන්න. ඔබ හෝ ඔබේ මිතුරන් අන්තර් ජාලය/සමාජ මාධ්‍ය අනිසි ලෙස භාවිතා කරන්නේ නම් ඕනෑම වේලාවක නීතියේ රැහැනට හසු විය හැකි බව සිහි තබාගන්න.




ඔබ, ඔබේ මිතුරෙකු හෝ වෙනත් දරුවෙකු අන්තර්ජාල අපයෝජනයේ ගොදුරක් බවට පත්වී ඇත්නම් එවැනි අපයෝජනයකට ලක්වීමට ඉඩ ඇති බව දැනේනේ නම්.

වහාම ඒ පිලිබඳව පහත සඳහන් දුරකථන අංක වලට දැනුම් දෙන්න;

- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 1929
- පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය 011 2 444 444
- අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව 0112 320141
- පීස් සංවිධානය 011 281 9397/071 273 3037


info@ecpat.lk
www.ecpat.lk


ecpat SRI LANKA

PEACE

# අන්තර්ජාලය තුළ ළමුන්ගේ ආරක්ෂාව සහතික කරමු




පරිසරය සහ සැමතැන වෙසෙන ළමුන් සුරැකීමේ සංවිධානය

# අන්තර්ජාලය භාවිතය

අන්තර්ජාලය විවිධ ආකාරයේ ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා භාවිතා කළ හැකිය. අන්තර්ජාලය ඉගෙනීමට සහ විනෝද වීමට කදිම ස්ථානයකි.

තවද එය විශ්වීය දැනුම ලබා ගැනීමටත් ඔබගේ දැනුම යාවත්කාලීන කරගැනීමටත් උපකාරීවේ.

කෙසේ වෙතත් අන්තර්ජාලය භාවිතා කිරීම ඉතා බුද්ධිමත්ව සහ ප්‍රවේසමෙන් කළ යුතුය.




# අන්තර්ජාලය අවභාවිතය

අන්තර්ජාලය  අවභාවිතය යනු අපරාධ කිරීමට හෝ නීතියට පටහැනි වෙනත් ඕනෑම දෙයක් කිරීමට එය භාවිතා කිරීමයි.

ළමුන් සහ අනෙකුත් පහසුවෙන් අවධානමට ලක්විය හැකි පුද්ගලයින්  අන්තර්ජාලය ඔස්සේ විවිධ  අපරාධ වලට  හසුකර ගැනීම සඳහා ඉලක්ක කරන අපරාධකරුවන් සිටී. බොහෝවිට ඔවුන් මෙවැනි වැරදි සිදුකරන්නේ තම ක්‍රියාවන්හි බරපතලකම හෝ බලපෑම නොදැනයි.

**COVID**-19 වසංගතයට සමගාමීව ශ්‍රී ශ්‍රී ලංකාව තුල 2020 වසරේදී  අන්තර්ජාල ළමා ලිංගික අපයෝජන සිද්ධීන් 15,800 පමණ වාර්තා විය මෙය 2019 වසරේ වාර්ථා වූ සිදුවීම්. 2, 600 ට සාපේක්ෂව 400%ඉහළ යාමකි **(groundviews.org)**

# අන්තර්ජාලය තුළ ප්‍රවේශම් වෙමු

ඔබ අන්තර්ජාලය  භාවිතා කරන අතරතුර, ඔබේ දත්ත විවිධ වෙබ් අඩවි සමඟ මුහුවීමට ඉඩකඩ ඇත.
අන්තර්ජාල හැකර් වරුන්ට හෝ අනෙකුත් අපරාධ කරුවන්ට ඔබට තර්ජනය කිරීමට හෝ ඔවුනට නිසි අයුරින් ඔබව හැසිරවීමට ඔබේ තොරතුරු අනිසි ලෙස භාවිතා කළ හැක.
එබැවින්, ඔබගේ  පුද්ගලික තොරතුරු, ඡායාරූප සහ වීඩියෝ වැනි දේවල් අන්තර්ජාලය ඔස්සේ බෙදා හැරීම, උඩුගත කිරීම සහ පළ කිරීමට පෙර දෙවරක් සිතන්න.
කිසිවෙකු සමඟ ඔබගේ බැංකු ගිණුම් විස්තර සහ මුරපද හුවමාරු කර නොගන්න.
අන්තර්ජාලය ඔස්සේ හමුවන මිතුරන් හට ඔබේ සම්පූර්ණ නම, ලිපිනය, දුරකථන අංකය, පවුලේ විස්තර, හෝ පාසල හෙළි කිරී-මෙන් වළකින්න.




# සමාජ මාධ්‍ය ප්‍රවේසමෙන් භාවිතා කරමු

ඔබට සමාජ මාධ්‍ය භාවිතයෙන් ලෝකයේ ඕනෑම තැනක සිටින ඕනෑම පුද්ගලයෙකු සමග පහසුවෙන් සම්බන්ධ විය හැක. තවද එමගින් ඕනෑම අයෙකුට හොඳ හෝ නරක චේතනාවෙන් ඔබ වෙත ළඟා විය හැක.

වෛරී ප්‍රකාශ සිදුකිරීම, ළමා ලිංගික අපයෝජන මාධ්‍යයන් බෙදා හැරීම සහ අන්තර්ජාලය ඔස්සේ සිදුවන හිරිහැර කිරීම් වැනි  අපරාධ බොහොමයක් බහුලව සමාජ මාධ්‍ය හරහා සිදු වේ.

සමාජ මාධ්‍යවල වැඩි මිතුරන් ප්‍රමාණයක්  හෝ අනුගාමිකයින් ලබා ගැනීම සඳහා දරුවන් දස දෙනෙකුගෙන් හතර දෙනෙක් ඔවුන්ගේ පෞද්ගලිකත්ව ආරක්ෂක සැකසුම් ඉවත් කරනු ලබයි. කෙසේවෙතත් අන්තර්ජාලය තුළින් ඔබට හමුවන මිතුරන්/අනුගාමිකයින් දස දෙනෙකුගෙන් සයදෙනෙකු සැබෑ මිතුරන් විය හැකි නමුත් ඉතිරි හතර දෙනා සැබෑ මිතුරන් නොවේ.




# අසභ්‍ය ප්‍රකාශන

අන්තර්ජාලය තුල අසැබි ඡායාරූප, වීඩියො, හඬ පටිගත කිරීම් ආදි ඕනෑම ආකාරයක නුසුදුසු  අන්තර්ගතයන්  නිෂ්පාදනය කිරීම, උඩුගත කිරීම හෝ  බෙදා හැරීම තහනම් වේ.
2021 වසර අවසාන භාගය වන විට Facebook, TikTok සහ Twitter වැනි සුප්‍රසිද්ධ සමාජ මාධ්‍ය ඔස්සේ ළමා ලිංගික අපයෝජන සම්බන්ධ පැමිණිලි මිලියන 126 කට ආසන්න ප්‍රමාණයක් ලැබී ඇති.